[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 8 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ..............................

**සැලකිය යුතුයි;**

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

## I - පත්‍රය

1) කාන්තාවන්ට පළමුවෙන්ම පැවිද්ද ලබා දීමට ඉදිරිපත් වූ හිමි නමකි.
   i. මහා කාශ්‍යප හිමි. ii. ආනන්ද හිමි. iii. දේවදත්ත හිමි. iv. මුගලන් හිමි.

2) "ගුරු බස සැබෑ ම ය - එය පිළිගැනුම යුතු ම ය ..."මෙම පද්‍යය ඇතුළත් කෘතිය වන්නේ,
   i. සිරිත් මල්දම ය.
   ii. ලෝවැඩ සඟරාව ය.
   iii. කාව්‍ය ශේඛරය ය.
   iv. බුදුගුණ අලංකාරය ය.

3) ධර්ම රත්නයේ ගුණ ඇතුළත් පාඨයෙහි කරුණු කීයක් සඳහන්වේ ද?
   i. කරුණු 6කි. ii. කරුණු 8කි. iii. කරුණු 9කි. iv. කරුණු 12කි.

4) බුදු ගුණ ඇතුළත් මංගල අෂ්ඨක ගායනය සිදු කරනු ලබන්නේ ,
   i. උපන්දින උත්සවවල දී ය.
   ii. මංගල උත්සවවල දී ය.
   iii. අවමංගල උත්සවවල දී ය.
   iv. ගෘහ ප්‍රවේශ මංගල්‍යයවල දී ය.

5) සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, ලෝක විදූ, සුගත යන මෙම ගුණ ඇතුළත් වන්නේ,
   i. බුද්ධ රත්නය තුළ ය.
   ii. ධර්ම රත්නය තුළ ය.
   iii. සංඝ රත්නය තුළ ය.
   iv. මංගල සූත්‍රය තුළ ය.

6) කෝලිත ,උපතිස්ස යන දෙදෙනාව ශාසනයට ඇතුළත් වූ පසුව හඳුන්වනු ලැබුවේ,
   i. අගසව් දෙනම ලෙස ය.
   ii. ද්වේවාචික උපාසකවරු ලෙස ය.
   iii. ඡබ්බග්ගිය භික්ෂූන් ලෙස ය.
   iv. තේවාචික උපාසකවරු ලෙස ය.

7) "මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි" යන ශික්ෂා පදයෙහි අර්ථය වන්නේ,
   i. සුරා පානයෙන් වැළකීම ය.
   ii. බොරු කීමෙන් වැළකීම ය.
   iii. කේලාම් කීමෙන් වැලකීම ය.
   iv. වැරදි කාම සේවනයෙන් වැළකීම ය.

8) භික්ෂූන් වහන්සේලා උදෙසා බුදුරදුන් විසින් පනවා ඇති සේඛියා ධර්ම රාශියකි.මෙහි **"සේඛියා"** ලෙස හඳුන්වනු ලබන්නේ,
   i. පන්සිල් ය. ii. දසසිල් ය. iii. ශික්ෂා පදය. iv. ඇඳුම් අඳින පිළිවෙළ ය.

9) සිගාලෝවාද සූත්‍රයට අනුව සම්මාන කිරීම අවමන් නොකිරීම යන යුතුකම් ඉටු කරනු ලබන්නේ,
i. භාර්යාව විසින් සැමියාට ය.
ii. දරුවන් විසින් දෙමව්පියන්ට ය.
iii. සැමියා විසින් භාර්යාවට ය.
iv. සිසුන් විසින් ගුරුවරුන්ට ය.

10) සිදුහත් බෝසතුන් ප්‍රඥාවෙන් අග තැන්පත් බව දැක්වෙන ජාතක කතාවකි.
i. මඛාදේව ජාතකය. ii. උම්මග්ග ජාතක ය. iii. සස ජාතකය. iv. වෙස්සන්තර ජාතකය.

11) අරියවංශ දේශනාව යනු ,
i. බෞද්ධයින් විසින් සිදුකරන ආගමික චාරිත්‍රයකි.
ii. හින්දු ආගමික චාරිත්‍රයකි.
iii. මුස්ලිම් ආගමික චාරිත්‍රයකි .
iv. පැරණි ලාංකේය උත්සවයකි.

I2) දම්සක් පැවතුම් සූත්‍රයට අනුව චතුරාර්ය සත්‍ය තුළ ඇතුළත් පළමු ආර්ය සත්‍ය වන්නේ,
i. සමුදය ආර්ය සත්‍යය යි.
ii. දුක්ඛ ආර්ය සත්‍යයය යි.
iii. නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යය යි.
iv. නිරෝධ ආර්ය සත්‍යය යි.

13) පංචස්කන්ධය නිවැරදිව ඇතුළත් පිළිතුර තෝරන්න.
i. ඇස, කන ,නාසය, දිව ,ශරීරය.
ii. කාලය, දීපය, දේශය ,කුලය, මව.
iii. කාමච්ඡන්ද, ව්‍යාපාද ,ථිනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච,විචිකිච්ඡා.
iv. රූප ,වේදනා, සංඥා ,සංඛාර, විඤ්ඤාණ.

14) කාම, භව, විභව යනුවෙන් හඳුන්වන්නේ,
i. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ය. ii. ත්‍රිවිධ තෘෂ්ණාව යි. iii. ත්‍රි ශික්ෂාව යි. iv. ත්‍රිවිධ බෝධිය යි.

15) පුද්ගලයාගේ මරණය සිදුවන ආකාර හතරක් බුදු දහමේ පෙන්වා දෙයි.එයින් ආයුෂ ගෙවීමෙන් සිදුවන මරණය හඳුන්වනු ලබන්නේ,
i. කම්මක්ඛය මරණය ලෙස ය.
ii. උභයක්ඛය මරණය ලෙස ය.
iii. උපච්ඡේදක මරණය ලෙස ය.
iv. ආයුක්ඛය මරණය ලෙස ය.

16) ගිහියාගේ නිත්‍ය ශීලය කුමක්ද?
i. ආජීවාෂ්ටමක ශීලය ය. ii. අටසිල් ය. iii පන්සිල් ය. iv. දස සිල් ය.

17) බුදුරජාණන් වහන්සේ විසින් අෂ්ට ගරුධර්ම ඉදිරිපත් කරන ලද්දේ කා හට ද?
i. ප්‍රජාපතී ගෝතමියට ය.
ii. විශාඛා උපාසිකාවට ය.
iii. කිසා ගෝතමියට ය.
iv. උත්පලවන්නා කුමරියට ය.

18) බුදු රදුන් පිරිනිවන් මඤ්චකයේ වැඩ සිටියදී ප්‍රශ්නයකට පිළිතුරු සොයා පැමිණියේ,
i. ආනන්ද හිමි ය.
ii. සුභද්‍ර පිරිවැජියා ය.
iii. උපාලි ගෘහපති ය.
iv. මහා කාශ්‍යප හිමි ය.

19) තෙරුවන්ගුණ ගණන ඇතුළත් පිළිතුර තෝරන්න.
i. 6කි. ii. 12කි. iii. 18කි. iv. 24කි.

20) ධම්ම පදය අයත් වන නිකාය වන්නේ,
i. අංගුත්තර නිකාය යි. ii. සංයුත්ත නිකාය යි. iii. ඛුද්දක නිකායයි. iv. දීඝ නිකායයි.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 8 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය | II | |
|---|---|---|---|---|

නම ..........................................................................................

සැලකිය යුතුයි;

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවල එක ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් II පත්‍රය සඳහා ලැබෙන මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 60කි .**

1) **ඔබේ පංතියට දෙවන වාරය සඳහා ලැබුණු ඇගයීම වූ භූමිකා රංගනය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

   i. භූමිකා රංගනය සඳහා ඔබේ පන්තිය තෝරාගත් පාඩමේ නම කුමක්ද?
   ii. භූමිකා රංගනය සඳහා සකස් කරන නාට්‍ය පිටපතේ ඇතුළත් චරිත දෙකක් නම් කරන්න.
   iii. භූමිකා රංගනය සඳහා ඔබට ලැබුණු චරිතය කුමක්ද?
   iv. භූමිකා රංගනයේ යෙදෙන අවස්ථාවේදී ඔබට මුහුණ දීමට සිදු වූ බාධක දෙකක් ලියන්න.
   v. භූමිකා රංගනයට ඔබ සපයා ගත් ද්‍රව්‍ය දෙකක් ලියන්න.
   vi. භූමිකා රංගනය තුළ ඔබගේ සිත්ගත් චරිත දෙකක් නම් කරන්න.
   vii. මහෞෂධ පඬිතුමා විසින් විසඳන ලද ප්‍රශ්න දෙකක් නම් කරන්න.
   viii. මහෞෂධ පඬිතුමාගේ දෙමාපියන් නම් කරන්න.
   ix. මෙම කතාවට පාදක වූ ජාතක කතාව කුමක්ද?
   x. ඔබට මුහුණ දීමට සිදුවූ ගැටලුවකදී ඔබ එම ගැටලුවට විසඳුම් සෙවූ ආකාරය පිළිබඳ වාක්‍ය දෙකක් ලියා දක්වන්න. **(ලකුණු 2 x 10 =20)**

2) i. සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ කා හට ද? **(ලකුණු 2)**
   ii. සිගාලෝවාද සූත්‍රයට අනුව භාර්යාව විසින් ස්වාමියාට ඉටුකල යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න. **(ලකුණු 3)**
   iii. ඔබ හොඳ මිතුරෙකු වශයෙන් ඔබගේ යහළුවාට ඉටු කරන යුතුකම් පහක් ලියන්න. **(ලකුණු 5)**

3) i. ධම්මපද කෘතිය තුළ ඇතුළත් ගාථා ගණන කීය ද?
   ii. “යෝච පුබ්බේ පමජ්ජිත්වා...” යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
   iii. එම ගාථාවට අදාළ නිදාන කතාව ඔබේ වචනයෙන් ලියන්න.

4) i. චාරිත්‍ර හා වාරිත්‍ර යන වදන්වල අර්ථ ලියන්න.
ii. පුද්ගල ජීවිතය තුළ මුහුණ දීමට සිදුවන මංගල අවස්ථා තුනක් නම් කරන්න.
iii. පිරිත් පිංකමක දී ඉටු කරන කාර්යයන් ඔබේ වචනයෙන් ලියා දක්වන්න.

5) i. දහම් ගුණ පාඨයෙහි ඇතුළත් දහම් ගුණ දෙකක් සඳහන් කරන්න.
ii. " කායේන ච සරණං යාමී..." මෙහි ඉතිරි පාද සම්පූර්ණ කර ලියන්න.
iii. ඔබ බුදුගුණ භාවනාව වැඩීම සඳහා සූදානම් වන කෙනෙකු යැයි සිතා එම භාවනාව වඩන අනු පිළිවෙල ලියා දක්වන්න.

6) i. දකුණු ඉන්දියාවෙන් පැමිණි බිසෝවරුන්ට ආගමික වතාවත් ඉටු කිරීම සඳහා ලංකාවේ ඉදි කෙරුණු ආගමික ස්ථානය වූයේ කුමක් ද?
ii. සියලු ආගම්වලට (සර්ව ආගමික)අදාළ උත්සව තුනක් නම් කරන්න.
iii. "එකමුතුකමින් අපි ජය ගනිමු" යන මාතෘකාවට අදාලව බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.

7) i. දුක්ඛ සත්‍යයට ඇතුළත් වන කරුණු දෙකක් නම් කරන්න.
ii. දුක්ඛ සත්‍යයෙහි ආකාර තුන සඳහන් කරන්න.
iii. දුක්ඛ සත්‍යය තුළ අන්තර්ගත වන ඔබ කැමති කරුණු දෙකක් විස්තර කර ලියා දක්වන්න.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

8 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II

# පිළිතුරු පත්‍ර

## පිළිතුරු පත්‍රය - I

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට ලැබෙනමුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

| | | | |
|---|---|---|---|
| (1) - ii | (6) - i | (11) - i | (16) - iii |
| (2) - i | (7) - ii | (12) - ii | (17) - i |
| (3) - i | (8) - iii | (13) - iv | (18) - ii |
| (4) - ii | (9) - iii | (14) - ii | (19) - iv |
| (5) - i | (10) - ii | (15) - iv | (20) - iii |

**(ලකුණු2 x 20 = 40)**

## පිළිතුරු පත්‍රය - II

(1)**ප්‍රශ්න අංක i සිට x දක්වා එක ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලබාදිය යුතු මුළු ලකුණු සංඛ්‍යාව 20කි.**

i. 11 පාඩම“උපාය කුසලතාවයෙන් යුතු වෙමු”.
ii. වෛදේහ රජතුමා, මහෞෂධ පඬිතුමා ,සිරිවඩ්ඪන සිටුතුමා, රට වැසියන්....යනා දී චරිත.
iii. සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.
iv. අදාළ අවස්ථාවේ දෙබස් අමතක වීම,දෙබස් පාඩම් කර ගැනීමට කාලය මදි වීම,අවශ්‍ය උපකරණ සොයා ගැනීමට නොහැකි වීම.....යනාදී වශයෙන් සිසුන් පිළිතුරු ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න.
v. නාට්‍ය පිටපත, කිහිරි දණ්ඩක්, වැලි, ජලය,බේසමක්...ආදි ද්‍රව්‍ය ලියා ඇත්නම් ලකුණු දෙකක් ලබා දෙන්න.
vi. මහෞෂධ පඬිතුමා ගේ චරිතය.වෛදේහ රජු ගේ චරිතය, සේවක චරිත, සේනක, පුක්කුස, කාවින්ද, දේවින්ද යන පඬිවරුන්ගේ චරිත...
vii. දණ්ඩක ප්‍රශ්නය හා වැලියොත් ප්‍රශ්නය.
viii. සිරිවඩ්ඪන සිටු තුමා හා සුමනා සිටු දියණිය.
ix. උම්මග්ග ජාතකය.
x. සිසුන් ලියා ඇති පිළිතුරු දෙස බලා ලකුණු ප්‍රදානය කරන්න. **(ලකුණු2 x10 = 20)**

- **ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ප්‍රශ්නවල එක කොටසට ලකුණු 2ක් ද,දෙක කොටසට ලකුණු 3ක් ද,තුන්වන කොටසට ලකුණු 5ක් දවන ආකාරයට මුළු ලකුණු 10ක් වන පරිදි ලබා දෙන්න.**

(2) i. සිගාලක කුමරු හට/ සිගාලක සිටු පුත්‍රයාට. **(ලකුණු 2)**

ii. 1. ගෙදර දොර කටයුතු සංවිධානාත්මකව කිරීම.
2. සැමියාගේ ඥාති මිත්‍ර සේවකයින්ට මැනවින් සැළකීම.
3. වෙනත් පුරුෂයන් නොපැතීම.
4. උපයාගත් ධනය ආරක්ෂා කිරීම.
5. දක්ෂව අනලස්ව සියලු කටයුතු ඉටු කිරීම. **(ලකුණු 3)**

iii. සිසුන් පිළිතුරු ලියා ඇති ආකාරය අනුව ලකුණු ප්‍රදානය කරන්න. **(ලකුණු 5)**

(3) i. ගාථා 423කි. (ලකුණු **2**)

ii. "යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝ ච චන්දිමා" (ලකුණු **3**)

iii. බුද්ධ ධර්මය 8 ශ්‍රේණිය - 7පාඩම පරිශීලනය කරන්න. (ලකුණු **5**)

(4) i. චාරිත්‍ර යනු - සිරිත් ය. /කළ යුතු දේවල් ය.
වාරිත්‍ර යනු - විරිත්ය./ නොකල යුතු දේවල් ය. (ලකුණු **2**)

ii. උපන්දින උත්සවය, සරණ මංගල්‍යය, වැඩිවිය පැමිණීමේ උත්සවය. (ලකුණු **3**)

iii. පිළිතුරු ලියා ඇති ආකාරය අනුව ලකුණු ප්‍රදානය කරන්න.( 8 ශ්‍රේණිය බුද්ධ ධර්මය 4 පාඩම පරිශීලනය කරන්න. (ලකුණු **5**)

(5) i. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහි පස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූහි. (ලකුණු **2**)

ii. "කායේන ච සරණං යාමි - වාචාය ච සරණං යාමි
මනසාපි ච සරණං යාමි - ධම්මං සරණං ගච්ඡාමි" (ලකුණු **3**)

iii. භාවනා වඩන සිසුවෙක් ය යන අදහස හැඟේ නම් ලියා ඇති පිළිතුරට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ලකුණු **5**)

(6) i. හින්දු දේවාල. (ලකුණු **2**)

ii. වෙසක්,පොසොන්,නත්තල්,දීපාවලී, රාමසාන් ආදී උත්සව. (ලකුණු **3**)

iii. බිත්ති පුවත්පතකට අදාළ තොරතුරුවල ඇති උචිත බව/තොරතුරු වල ඇති සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව/අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ ඇති යෝග්‍ය බව/ අන්තර්ගතයේ ඇති නිර්මාණශීලී බව හා තර්කානුකූල බව /නිමැයුමෙහි ඇති සාර්ථක බව… යනාදී අංග සම්පූර්ණව ඇත්නම් මුලු ලකුණු ලබා දෙන්න. (ලකුණු **5**)

(7) i. ජාති, ජරා, ව්‍යාධි, මරණ,අප්‍රියයන් හා එක්වීම,ප්‍රියයන්ගෙන් වෙන් වීම,කැමති දේ නොලැබීම. (ලකුණු **2**)

ii. දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක)/විපරිණාම දුක්ඛතා (වෙනස්වීම පිළිබඳ දුක)/සංඛාර දුක්ඛතා (සංස්කාර පිළිබඳ දුක) (ලකුණු **3**)

iii. බුද්ධ ධර්මය 8 ශ්‍රේණිය 13 පාඩම පරිශීලනය කරන්න. පිළිතුරු ලියා ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු **5**)

# LOL.lk
## BookStore



# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**